# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2024/47 - 2017 ජුනි මස 23 වැනි සිකුරාදා - 2017.06.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් පළාත් සභාවේ 2014 අංක 2 දරන මුල් ළමාවිය ප්‍රඥප්තිය

ඌව පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන මුල් ළමාවිය ප්‍රඥප්තියේ 42 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාවේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය දොන් ආතර් චාමර සම්පත් දසනායක වන මා විසින් පහත දක්වෙන නියෝග පනවන ලද බව මෙයින් දැනුම් දෙමි.

ඩී. ඒ. චාමර සම්පත් දසනායක,
ඌව පළාතේ පළාත් සභාවේ මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති,
ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය,
ඌව පළාතේ පළාත් සභාව.

2017 ජුනි මස 14 වැනි දින,
රජ වීදිය,
බදුල්ල,
අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන මුල් ළමාවිය ප්‍රඥප්තිය යටතේ සම්පාදිත නියෝග**

1. මෙම නියෝග ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන නියෝග ලෙස හඳුන්වනු ලබන අතර *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

2. මෙහි මින් මතු ''නියෝග'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් මුල් ළමාවිය සංවර්ධන නියෝග සම්බන්ධයෙන් පැන නගින ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් මෙහි මින් මතු ''අමාත්‍යවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් සභවේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

3. (1) මින් මතුමතු ''ප්‍රඥප්තිය'' යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන මුල් ළමාවිය ප්‍රඥප්තියේ 18.1(අ) වගන්තිය අනුව මෙහි මින්මතු ''මධ්‍යස්ථානය'' යනුවෙන් හඳුන්වනු ලබන මුල් ළමාවිය අධ්‍යාපන

සංවර්ධන මධ්‍යස්ථානයක භූමිය හා පිහිටීම පහත සඳහන් පරිදි ස්වාභාවික අනතුරුවලින් සහ උපද්‍රව වලින් තොර ස්ථානයක් විය යුතු ය.

(අ) පොකුණු, ඇළ, දෙළ, වැව්, බැවුම්, වගුරුබිම්, නාය යන හා නාය යාමට ඉඩ ඇති ගල් පෙරළන වැබුම් සහිත ස්ථාන, කටුපඳුරු, හුඹස් (සර්පයන් සිටිය හැකි), විසකුරු සතුන් ගැවසෙන වන රොදවල් ආදියට ආසන්න ස්ථානයක් නොවිය යුතු ය.

(ආ) අධි බලැති විදුලි රැහැන්, ඉන්ධන පිරවුම්හල්, සම්ප්‍රේෂණ කුළුණු, විවෘත ළිං හා රේල් පාර ආදියට ආසන්න ස්ථානයක් නොවිය යුතුය.

(ඇ) කර්මාන්ත ශාලා, ගල් මෝල්, වී මෝල්, ගල් වලවල්, කසල හා අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන, කසල ප්‍රතිචක්‍රීය කරන ස්ථානවලට මීටර් පන්සීයයක දුරින් පිහිටිය යුතු ය.

(ඈ) අධික ලෙස රථවාහන ගමන් කරන ස්ථාන, සති පොළවල්, ගරාජ්, මස් මාංශ වෙළඳසැල්, අවමංගලශාලා, බස් නැවතුම්පොළවල්, අධික ලෙස ජනගහනය ගැවසෙන ස්ථාන ආදියෙන් මීටර් දෙසීයක් දුරින් පිහිටිය යුතු ය.

(ඉ) මත්පැන් ශාලා, සිනමා ශාලා, වීඩියෝ දර්ශන විකුණුම් ස්ථාන, ශබ්ද පටිගත කිරීමේ වෙළඳ සැල් ආදියෙන් මීටර් දෙසිය පනහක් දුරින් පිහිටිය යුතු ය.

(2) ප්‍රඥප්තියේ 18.1(උ) වගන්තිය යටතේ ළමුන්ගේ ක්‍රියාකාරකම් සංවර්ධනය කෙරෙන පහත සඳහන් (අ) සිට (උ) දක්වා එක් එක් අංශය යටතේ ක්‍රීඩා උපකරණ සහ භාණ්ඩ එකක් හෝ කිහිපයක් සෑම මධ්‍යස්ථායකම තිබිය යුතු ය.

*(අ) නැගීමට අදාළ ක්‍රියාකාරකම් :*

i. ලිස්සන බෝට්ටු,
ii. කඳු නැගීම,
iii. ඉනිමන් (පොල් කටු, ලී, ලැලී),
iv. කොට ඇල,
v. පිරමිඩ නැගීම,
vi. අට්ටාල,
vii. බංකරය,
viii. කිතුලේ නැගීම.

*(ආ) රිංගීමට හා බඩගෑමට අදාළ ක්‍රියාකාරකම් :*

i. පොලු ආරුක්කු මාර්ගය,
ii. පැදුරු බිංගෙය, බැරල් බිංගෙය,
iii. උමග සහ කාමර,
iv. ටයර් උමග

*(ඇ) සමබරතාවයට අදළ ක්‍රියාකාරකම් :*

i. ඒදණ්ඩ,
ii. ටයර් මත ඇවිදීම,
iii. සංගිලි පාලම,
iv. වැල් පාලම,
v. පොල් කටු බොරු කකුල්,
vi. ඔංචිල්ලාව.

*(ඈ) සැළසුම්ගත ක්‍රියාවලට අදාළ ක්‍රියාකාරකම් :*

i. බට්ටා පැනීම,
ii. වලකජු ගැසීම - නිසි ස්ථානයක සැකසීම.

(ඉ) ඇවිදීමට අදළ ක්‍රියාකාරකම් :

i. අල්ලි මත ඇවිදීම,
ii. නිදහස් ඇවිදීම,
iii. පුවක් අරඹේ ඇවිදීම,
iv. රේල් පාර,

(ඊ) පැනීමට අදළ ක්‍රියාකාරකම් :

i. වැලි ළිඳ.

(උ) විසි කිරීමට අදාළ ක්‍රියාකාරකම් :

i. බෝල විදිනය,
ii. ඉලක්කයට ගැසීම.

(ඌ) වෙනත් :

i. සෙල්ලම් ගෙය,
ii. සෙල්ලම් කඩය,
ii. සෙල්ලම් අල්මාරිය

(3) ප්‍රඥප්තියේ 18.1 (ඓ) වගන්තිය යටතේ මධ්‍යස්ථානයේ ලී බඩු උපකරණ පහත සඳහන් ප්‍රමිතියෙන් යුක්ත විය යුතු ය.

(අ) මේසය රවුම් නම් විශ්කම්භය අඩි තුනක් ද, උස අඟල් විස්සක් ද තිබිය යුතු ය. මේසය හතරැස් නම් උස අඟල් විස්සක් ද, පළල අඩි තුනක් ද, දිග අඩි තුනක් ද තිබිය යුතු ය.

(ආ) පුටුවේ කකුල්වල උස අඟල් දොළහක් ද, දිග අඩි එකක් ද, පළල අඩි එකක් ද, ඇන්දේ උස අඟල් විසි හතරක් ද විය යුතු ය.

4. (1) ප්‍රඥප්තියේ 20 වගන්තියට අනුව පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථානයක හෝ මධ්‍යස්ථානයක් පැවැත්වීමට බලාපොරොත්තු වන පරිශ්‍රයක පහත සඳහන් පහසුකම් සලසා තිබිය යුතු ය.

(අ) සෑම ගොඩනැගිල්ලක්ම ස්ථිර ගොඩනැගිල්ලක් විය යුතු ය.

(ආ) ගොඩනැගිල්ලේ බිත්ති කොට නම් බිත්තිය මීටර් එකකට වඩා උස විය යුතු අතර වැසි සුළං හා දැඩි හිරු එළියෙන් ආරක්ෂා විය යුතු ය.

(ඇ) මධ්‍යස්ථානයේ දොරටුව අනාරක්ෂිත ලෙස ප්‍රධාන පාරට මුහුණලා සකස් නොකළ යුතු ය. ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති සෑම මධ්‍යස්ථානයකම භූමි සීමාව අඩි 2 1/2ක් උස තාප්පයකින් හා අඩි හතරක් උස් දැල් ආවරණයකින් යුක්ත විය යුතු ය.

(ඈ) මධ්‍යස්ථානයේ මුළු භූමියෙන් 1/8ක අවම ශාක ආවරණයකින් යුක්ත විය යුතු ය.

(ඉ) ඉගෙනුම් කව සහ එළිමහන් ක්‍රීඩා සඳහා ප්‍රමාණවත් ඉඩක් තිබිය යුතු ය.

(ඊ) ළමුන්ට භාවිතයට ගත හැකි ලෙස පොළොවේ සිට අඟල් දහ අටක් ඉහළින් බිත්ති කළු ලෑල්ලක් තිබිය යුතු ය.

(උ) කළාල, බුමුතුරුණු, පැදුරු ප්‍රමාණවත් ලෙස තිබිය යුතු ය.

(ඌ) දැන්වීම් පුවරුවක් තිබිය යුතු ය.

(එ) සෞන්දර්යය උපකරණ ප්‍රමාණවත් ලෙස තිබිය යුතු ය.

(ඒ) එක් ජල කරාමයක් හෝ ජලය ලබා ගැනීමට පහසුකම් තිබිය යුතු ය. එසේ නොමැති අවස්ථාවලදී බීමට පිරිසිදු පානීය ජලය සහ අනෙකුත් ජල අවශ්‍යතා සඳහා ළමුන්ට භාවිතා කළ හැකි උසකින් ආරක්ෂා සහිතව සුදුසු පරිදි ජලය රැස් කර තබා ගත යුතු ය.

(ඔ) කායික ආබාධ සහිත ළමුන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රවේශ පහසුකම් හා වෙනත් පහසුකම් ද පැවතිය යුතු ය.

(ඕ) මුළුතැන්ගෙයක් සහ ඒ සඳහා අවශ්‍ය භාජන හා ඒවා තැබීමට සුදුසු ස්ථානයක් තිබිය යුතු ය.

(ක) ළමා චිත්‍ර ආදී නිමවුම් ප්‍රදර්ශන සඳහා බිත්තියේ ප්‍රමාණවත් ඉඩක් හෝ පුවරු ලෙස ඉඩකඩ වෙන්කර තිබිය යුතු ය.

(ග) දරුවන්ගේ වාර්තා, ක්‍රීඩා උපකරණ, පොත්පත් සහ වෙනත් ආරක්ෂා කළ යුතු දෑ සඳහා ගබඩා කාමරයක් හෝ වෙනත් පහසුකම් තිබිය යුතු ය.

(ජ) ගොඩනැගිල්ලේ ඉඩකඩ අනුව බෝතල්, බෑග්, කුඩ ආදීය තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩක් වෙන්කළ යුතු ය.

5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම නියෝග වල :

''අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාත් සභාවේ අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයා ද,

''ප්‍රඥප්තිය'' යන්නෙන් ඌව පළාත් සභාවේ 2014 අංක 02 දරන මුල් ළමාවිය ප්‍රඥප්තිය ද,

''මධ්‍යස්ථානය'' යන්නෙන් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයක් ද,

''ඉගෙනුම් කව'' යන්නෙන් සංස්කෘතික කවය, පරිසර කවය, ජීවන කුසලතා කවය සහ පරිසර ගවේෂණ කවය ද,

අදහස් වන්නේ ය.

6. මේ නියෝගවල සිංහල සහ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

07-209

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.